# වැඩ බැරි දූස · ගැන කතා

නිකොලායි නොසව්




8



# ගමනක මුල

දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ · මොස්කව්



# වැඩි බැරී ළුස් ශැණ කතා

8

## නිකොලායි නෝසව්

# ගමනක මුල

අනුවාදය – දැදිගම වි. රුද්‍රිගු

චිත්‍ර – බරීස් කලෞෂින්




දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ
මොස්කව්





බැලුමට උණුසුම් වාතය පිරවීම අවසන් විය. විශාල තඹ හැලිය ඉවත් කරන ලෙස කියා සිටි දක්ස පාල බැලුමේ අග ඇති රබර් නලය එයා ගේ අතින් ම බැඳ දැම්මා. එහෙම කළේ උණුසුම් වාතය පිට නො වීමට ය. ගමනට සූදානම් අයට කූඩයට නගින්න කියලා දක්ස පාල කිව්වා. අන් අයට ඉස්සෙල්ලා නැංගේ කඩිනම් රාළ. ඊළඟට බොත්තම් පුංචා නැංගේ අනික් කුරුමිට්ටන් ගේ ඇහේ හැප්පෙමින්. එයා බොහොම මහත යි, එයා ගේ සාක්කු වල නොයෙක් දේ පුරවලා. සීනි කැට, විස්කෝත්තු. එයා සපත්තුවලට උඩින් අඳින රබර් කවර ත් සමග සපත්තු ඇඳලා, කුඩයක් අතින් අරගෙන. බොත්තම් පුංචාට බැලුම සවිකර ඇති කූඩයේ වාඩිවීමට අනික් අය උදව් කළා. අනික් අය වාඩි කරවීමට සූකිරි බොහොම මහන්සි වුනා.

''කරුණාකරල වාඩි වෙන්න. පහසු ලෙස ඉඳ ගන්න. ගුවන් බැලුමේ සැමට ම ඉඩ තියෙනවා,'' සූකිරි කියනවා.

''ඔය ත් වාඩි වෙන්න!'' එයාට අනික් අය කිව්වා.

''මට බැරි යැ. ඔය ගොල්ල වාඩි වෙන්න,'' සූකිරි පිළිතුරු දුන්නා.

එයා අනික් අය ගේ වැළමිටෙන් අල්ලා වාඩි කැරෙව්වා.

ඔන්න ඉතින් කුරුමිට්ටෝ සියලු දෙනා ම කූඩයට නැග ගත්තා. සූකිරි විතරක් පහළට වෙලා ඉන්නවා.

"ඔයා වාඩි නො වන්නේ මොක ද?" ඔහු ගෙන් ඇසුවා.

"මම නො යන එක වඩා හොඳ යි නෙව. මම බොහොම මහත යි. මම නැතුවට ඔතැන ඉඩ මදි වෙලා. බැලුමට බර වැඩි වෙයි කියලා බය යි," සූකිරි කිව්වා.


"ඔයා බය වෙන්න එපා. බර වැඩි වෙන්නේ නැහැ."

"අනේ සෝයුරනි, මා නැතුවට කමක් නැහැ. ඔය ළමයින් එන තුරු මම මෙතැන ඉන්නම්. ඔය ගොල්ලන්ට මම කරදර කරන්නේ මොකට ද!"

"කිසි ම කරදරයක් නැහැ! වාඩි වෙන්න. අපි ගුවනින් යාමට තීරණය කළ නිසා එක් වෙලා, එකට යමු," දක්ස පාල කිව්වා.

සූකිරි කූඩයට නැංගේ කැමැත්තෙන් නො වේ. හිටි හැටියේ ම බලාපොරොත්තු නො වූ දෙයක් සිද්ද වුනා: බැලුම යි, කූඩය යි දෙක ම බිමට පාත් වුනා.

"ඕං බලපල්ලා ගුවනේ ගිය හැටි!" වැට අයිනට වෙලා හිටියා බට්ටිච්චා හිනා වුනා.





''නුඹ හිනා වෙන්නේ මොක ද?'' බට්ටා බට්ටිච්චාට සැරවුනා. ''මෙතැන අවාසනාවක්, නුඹ හිනා වෙනවා!''

''ඕක අවාසනාවක් නො වෙයි. ඔය බැලුමෙන් ඉගිලෙන්නට පුළුවන් පහළොස් දෙනෙකුට විතර යි. දහසය දෙනෙක් නැංගා. ඉතින් බැලුමට බැහැ ඉහළ නගින්නට,'' වීදුරු බටේ කියුවා.

''එහෙනම් ඉගිලෙන්නේ නැද්ද?'' බට්ටා ඇසුවා.

''එක කුරුමිට්ටෙකුව බිම තියලා යන්න ඕන. එවිට ඉගිලෙන්න ඇහැකි,'' වීදුර බටේ විස්තර කළා.

''වැඩ බැරි ආසව බිම බස්සවනවා වෙන්නට ඕන,'' බට්ටිච්චි කියුවා.

ගුවනින් යාමට බය සූකිරි බොහොම සතුටු වෙලා මෙහෙම කියාපි:

''මම කිව්වා නෙව ද බර වැඩි වෙනවා කියලා! මම බිමට බහින්නම්. එය වඩා ත් හොඳ යි.''

සූකිරි බිමට බහින්නට කූඩයට උඩින් පය දැම්මා. ඔන්න එවිට ම දක්ස පාල කූඩයේ තිබුණ වැලි මිටියක් බිමට වීසි කළා විතර යි, බැලුම ආයෙමත් ඉහළ නගින්නට පටන් ගත්තා. දක්ස පාල වැලි මිටි කූඩයට දැමූ හේතුව දැන් අනික් අය තේරුම් ගත්තා. රැස්වෙලා හිටිය අය අත් පුඩි ගැහැව්වා. දක්ස පාල අතක් ඔසොවලා කතා කළා:


''සෝයුරනි, ආයුබෝවන්! අපි ඈත රටවලට ගුවනින් යනවා. සුමානයකින් ආපහු එනවා. එතෙක් ආයුබෝ වේවා!''


''ආයුබෝ වේවා! ජය වේවා! සුබ ගමන්!'' කුරුමිට්ටෝ සුබ පැතුවා. සමහරු අත් වැනුවා, තොප්පි උඩ වීසි කළා, ප්‍රීතිය පළ කළා.

දක්ස පාල සාක්කුවෙන් කුඩා පිහියක් ගෙනැ බැලුම පඳුරට බැඳලා තිබුණ











ලනුව කපා දැම්මා. බැලුම යම්තමින් ඉහළ නැගලා ගහේ අත්තකට ඇමිනී ටික වේලාවක් එක තැන ඉඳලා, ආයෙමත් ඉහළට නැංගා.

''ජය වේවා! අක්ස පාලට සහ එයා ගේ යාළුවන්ට සුබ ගමන්!''









අත් පුඩි ගහලා, තොප්පි උඩ වීසි කළා. පුංචි ළමයි එකිනෙකා බදා ගත්තා. බට්ටිච්චි සහ සිරිමලී එකිනෙකාව සිප ගත්තා. ඩේසි ඇඬුවා.

බැලුම දිගින් දිගට ම ඉහළ නැංගා. සුළඟ නිසා බැලුම එක් පැත්තකට ගසා ගෙන ගියා. දැන් එය පෙනුණේ නිල්වන් අහසේ ඇති පුංචි ලපයක් වගෙයි. වීදුරු බටේ වහල උඩ නැගලා එයා ගේ දුර දක්නයෙන් අර පුංචි ලපය දිහා බැලුවා. ඔහු අසලින් වහල උඩ හිටියේ කවි කුසුම්. කවියා දැත් පපුව මත තබා ගෙනැ කුරුමිට්ටන් ගේ ජය හඬට කන් දෙමින්, ඔවුන් දෙස බලා යමක් ගැන කල්පනා කළා. හිටි හැටියේ ම, කවි කුසුම් දැත් පළල් කර හිට ගෙන කෑ ගැසුවා:



''අහපල්ලා! මගේ කවි අහපල්ලා!''

අවට නිහඬ වුනා. හැම දෙනා ම කවි කුසුම් දිහා බැලුවා.

''කවි! දැන් එයා කවි කියාවි!'' කුරුමිට්ටෝ මුණු මුණු ගාලා කියුවා.

කවි කුසුම් පූර්ණ නිහඬතාවය ඇති වන තුරු ටිකක් නැවතී සිටියා. ඔහු ඈත යන බැලුම දෙසට අතක් ඔසොවා යම්තම් උගුර බුරුල් කැරැ ගෙන, ආයෙමත් මෙහෙම කියුවා:

''කවි.''

මේ දැන් එයා ගොතපු කවි හිටි වන ම කියන්නට පටන් ගත්තා:

බැලුමක් හදලා නැංගා අහසට
තිළිණයකි, එය මිනිස් මොලයට
මිට්ටෝ අපේ නොවෙති කුරුල්ලන්
ගුවනින් යාමට ඔවුන් දක්සයන්.
මිනිහ ගෙ මොලයට නො හැකි වැඩක් නැත!
ගුවනින් යාමට තව ඉඩකඩ ඇත!



කවියේ තාලය අනුව කුරුමිට්ටෝ අත් පුඩි ගහන්නට පටන් ගත්තා. මිට්ටෝ කවි කුසුම්ව වහලෙන් පහළට අරගෙන එයා ගේ ගෙදර දක්වා එයාව ඔසොවා ගෙන ගියා. පුංචි කෙල්ලෝ එයා ගේ ඇඟට මල් පෙති වීසි කළා. එදා කවි කුසුම් ප්‍රසිද්ධ වුනේ හරියට ගුවනේ පාවෙන බැලුම එයා හදලා, එයා ශියාසර කළා වගෙ යි. එයා ගේ කවි, කුසුම් පුරයේ හැම කෙනෙක් ම කියමින් ප්‍රීති වෙන්නට පටන් ගත්තා.

එදා කුසුම් පුරයේ හැම තැන ම කවි කුසුම් ගේ ගීතය රැව් දුන්නා:

මිනිහ ගෙ මොලයට නො හැකි වැඩක් නැත!
ගුවනින් යාමට තව ඉඩකඩ ඇත!



**Н. Носов**

В ПУТЬ

*На языке сингала*

© සිංහල අනුවාදය සහ චිත්‍ර,
දේදුන්න (රාදුගා) ප්‍රකාශකයෝ,
මොස්කව්, 1986







වැඩ බැරි දාස ගේ හපන්කම් ගැන ඔබ වැඩිදුරටත් සැලකිලි දක්වති නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරති නම්, මෙම පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

**වලාකුළට උඩින් ගියා**

**අනතුර**

ISBN 5-05-001067-5
ISBN 5-05-001069-1